# සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල 2021 (සිංහල මාධ්‍ය)

## හැඳින්වීම

නාට්‍ය හා රංග කලා විෂය පිළිබඳ ප්‍රායෝගික සහ විෂයානුබද්ධ අත්දැකීම් රාශියක් දිවයිනේ පාසල්වල සිසුනට ලබාදීමත්, සිසුන් සහ ගුරුවරුන් නිර්මාණකාර්යයට යොමුකිරීමත්, ඔවුන්ගේ නාට්‍ය රඟපෑමේ හැකියාවන් වර්ධනය කොට වින්දන ශක්තීන් දියුණු කිරීමත් යන අභිප්‍රායන් පෙරදැරි කොටගෙන මෙම උළෙල සංවිධානය කෙරේ. පාසල්වල දැනට ක්‍රියාත්මක වන විෂයමාලාවෙහි නාට්‍ය හා රංගකලා විෂය 6 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ම ඇතුළත්ව ඇති බැවින් මෙම උළෙල සංවිධානය කිරීමෙන් එම විෂය සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් ලැබෙනු ඇත. සිසුන් තුළ යහපත් ආකල්ප පෝෂණය කරමින් ජාතියේ සංවර්ධනය අරමුණු කොට ගෙන සිය දරු දැරියන්ගේ පෞරුෂය සංවර්ධනය කිරීම උදෙසා ද මෙම උළෙල දායක වේ. ඉන් ජාතික මට්ටමින් ඇගයීමට ලක් කෙරෙන සිසුන් උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ප්‍රමුඛතාවයට පත් වේ.

## උළෙල පිළිබඳ පොදු නීති රීති

**1. මෙම උළෙලේ සිංහල මාධ්‍ය අංශය පහත සඳහන් පරිදි කාණ්ඩ තුනකට බෙදේ.**

- 1 කාණ්ඩය - **කෙටි නාට්‍ය නිෂ්පාදන** (ළමා නාට්‍ය, කෙටි නාට්‍ය, ළමා ප්‍රේක්ෂාගාරයක් සඳහා විශ්ව සාහිත්‍ය පාදක නාට්‍ය, පරීක්ෂණාත්මක හා විකල්ප නාට්‍ය ප්‍රවේශයන් සහ ජීසපාත්‍රු නාට්‍ය ඇතුළු වාර්ෂිකව ඇතුළත් කිරීමට හෝ සංශෝධනයට ලක්ව ඇති වෙනත් අංග)
- 2 කාණ්ඩය - **නිර්දේශිත නාට්‍ය ජවනිකා** (යෝජිත දේශීය/විදේශීය නාට්‍යකරුවන්ගේ නාට්‍ය, සංස්කෘත, ග්‍රීක, රෝම හා ශේක්ස්පියර් නාට්‍ය සහ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍ය ජවනිකා ප්‍රතිනිර්මාණය සහ වාර්ෂිකව ඇතුළත් කිරීමට හෝ සංශෝධනයට ලක්ව ඇති වෙනත් අංග)
- 3 කාණ්ඩය - **භූමිකා රංගන** (නිර්දේශ කරන සංවාද කාණ්ඩයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම, කතාන්දර කථනය, අභිරූපණ සහ වාර්ෂිකව ඇතුළත් කිරීමට හෝ සංශෝධනයට ලක්ව ඇති වෙනත් අංග)

**2. රංගන දායකත්වය අනුව මෙම උළෙල පහත සඳහන් පරිදි අංශ 04 කට බෙදා ඇත.**

- ප්‍රාථමික අංශය - (1-5 දක්වා ශ්‍රේණි සඳහා)
- කනිෂ්ඨ ද්විතීයික අංශය - (6-9 දක්වා ශ්‍රේණි සඳහා)
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය - (10-13 දක්වා ශ්‍රේණි සඳහා)
- විවෘත අංශය - (1-13 දක්වා ශ්‍රේණි සඳහා)

2.1 1 හෝ 2 කාණ්ඩයන් ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයෙන් ඉදිරිපත් කරන යම් නාට්‍යයක පෙළ විසින් ඉල්ලා සිටිනු ලැබෙන **සුවිශේෂ අවස්ථාවක දී** පහළ ශ්‍රේණියක දරුවෙක් හෝ කිහිප දෙනෙක් රංගනය සඳහා අත්‍යවශ්‍ය වේ නම් පූර්ව අවසරයක් මත පමණක් එසේ කළ හැකි ය. අයදුම්පත හෝ අයදුම්පත සමඟ නාට්‍ය පිටපත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අවස්ථාවේ දී එම ඉල්ලීම ලිඛිතව අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලීම නිර්මාණයේ සාර්ථකත්වය සඳහා සාධාරණ බැව් සමාලෝචනයේ දී පෙනී යන්නේ නම් පමණක් ඒ සඳහා අවසර ලබා දේ.

**3. මෙම උළෙලේ ජාතික වටයේ නාට්‍ය වේදිකාගත කිරීම පහත සඳහන් පරිදි අදියර දෙකකට බෙදා ඇත.**

- 1 අදියර - (2 කාණ්ඩය සඳහා)
- 2 අදියර - (1 හා 3 කාණ්ඩ සඳහා)

## 4. සහභාගීත්වය

4.1 රජයේ පාසල්වල සිසුන්, පිරිවෙන්වල ඉගෙනුම ලබන සිසුන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත පෞද්ගලික පාසල්වල සිසුන්ට සහ ගුරු භවතුන්ට මෙම උළෙල සඳහා සහභාගී විය හැක.

4.2 නාට්‍ය හා රංග කලා විෂය ඉගැන්වෙන පාසල්වල සිසුන් හා ගුරු භවතුන් මෙම උළෙලට **අනිවාර්යයෙන්ම** සහභාගි වීම අපේක්ෂා කෙරේ.

4.3 මෙම උළෙලට යම් පාසලක 01 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සහභාගී වීමට හැකි අතර, එම විද්‍යාල උළෙලට අයදුම් කරන වර්ෂයේ දී එම විද්‍යාල මගින් පද වන විට උසස් පෙළ විභාගය සඳහා, පෙනී සිටින සිසුන්ට එම වර්ෂයේ ජූලි මස 31 දින තෙක් සහභාගී විය හැකි ය.

4.4 මීට පෙර සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා තරගයන්ට හා සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලවලට ඉදිරිපත් කොට ජයග්‍රහණ ලබාගත් පිටපත්, හෝ නිර්මාණ මෙම උළෙල සඳහා නැවත නිෂ්පාදනය කළ නො හැකිය.

4.5 උළෙල පැවැත්වෙන වර්ෂයට පූර්වාසන්න වර්ෂ දෙකකි දී ම මෙම උළෙල සඳහා **අඛණ්ඩව එකම ශීර්ෂය** යටතේ සමස්ත ලංකා මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන අතරින් කවර හෝ ස්ථානයක් ලබා ගත් පාසලකට උළෙලට අදාළ වර්ෂයේ **දී එම ශීර්ෂයෙන්ම / ශීර්ෂවලින්ම ඉදිරිපත් විය නොහැක.**

4.6 ඉහත 4.5 වගන්තියේ සීමාවන්ට යටත්ව, මෙම චක්‍රලේඛයෙහි 2 **කාණ්ඩයේ** නාට්‍ය ශීර්ෂයන්ට අයත් වන නාට්‍යයන්ගෙන් කවර හෝ නාට්‍යයක කොටසක් මීට පෙර සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලට ඉදිරිපත් කළ කිසියම් පාසලකට, තමන් ඒ සඳහා ඉදිරිපත් කළ නාට්‍ය කොටසම නැවත ඉදිරිපත් කළ නොහැකි ය. එම නාට්‍යයේම වෙනත් කොටසකින් ඒ සඳහා සහභාගී වීමට බාධාවක් නොමැත.

4.7 වෙනත් පාසලක ගුරුවරයකු හෝ ශිෂ්‍යයකු නොවන බාහිර ශිල්පීන්, කිසිදු විධායක ආනුෂංගික ශිල්පීය අවශ්‍යතාවන් සඳහා සහභාගි කරවා නො ගත යුතු අතර වෙනත් පාසලක ගුරු භවතෙක් ආනුෂංගික ශිල්පීය අවශ්‍යතාවන් සඳහා සහභාගී කර ගත යුත්තේ ද ඉදිරිපත් වූ පාසල අයත් කලාපය තුළින් පමණි.

4.8 2021 වර්ෂයේ දී සමූහගත් අංග රචනයට විද්‍යාල අයත් කලාපයෙන් පමණක් ගුරුභවතකු සහභාගී කර ගත හැකි ය. 2022 වර්ෂයේ පටන් අංග රචනය සිදු කළ යුත්තේ එම විද්‍යාලේම ගුරු භවතෙකු හෝ සිසු දරුවකු විසින් පමණක් බැවින් මෙම ශිල්පීය අවශ්‍යතාවට ඉදිරිපත් වන පාසලේම ගුරු භවතුන් සහ සිසු දරුවන් පුරුදු පුහුණු වීම විෂය සංවර්ධනයට අතිශයින් වැදගත් බව අවධාරණය කෙරේ.

4.9 තම පාසල මෙම උළෙලට සහභාගී කරවීම සහ අවශ්‍ය සියලු සහයෝගයන් ලබා දීම විෂය භාර ගුරුවරුන්ගේ ද, විදුහල්පතිවරුන්ගේ ද වගකීම වන අතර මෙම උපදෙස් සංග්‍රහයේ සහ චක්‍රලේඛයේ සීමාවන් යටතේ පාසලට අනුමත ශීර්ෂ සංයෝජනයන්ට අනුව උළෙලට සම්බන්ධ වීමට තම පළාතේ හා කලාපයේ පාසල් දිරි ගැන්වීම අදාළ පළාතේ / අධ්‍යාපන කලාපයේ සෞන්දර්ය විෂය භාර නිලධාරීන්ගේ වගකීම වේ.

## 5. අයදුම් කිරීම

5.1 1 කාණ්ඩයට ඉදිරිපත් වන පාසල්වලට 2 කාණ්ඩය සඳහා ඉදිරිපත් විය නොහැකි අතර 3 කාණ්ඩයේ සියලු ශීර්ෂයන් සඳහා ඉදිරිපත් විය හැකි ය.

5.2 2 කාණ්ඩය සඳහා ඉදිරිපත් වන පාසල්වලට 1 කාණ්ඩය සඳහා ඉදිරිපත් විය නොහැකි අතර 3 කාණ්ඩයේ සියලු ශීර්ෂයන් සඳහා ඉදිරිපත් විය හැකි ය.

5.3 3 කාණ්ඩයට අයදුම් කළ හැක්කේ 1 කාණ්ඩයේ හෝ 2 කාණ්ඩයේ නාට්‍ය නිෂ්පාදනයක් සඳහා අයදුම් කරන පාසල්වලට පමණි.

5.4 1 හෝ 2 කාණ්ඩයෙන් පාසලකට ඉදිරිපත් කළ හැකි උපරිම ශීර්ෂ සංඛ්‍යාව 02 ක් වන අතර 3 කාණ්ඩය හෙවත් භූමිකා රංගන කතා පුවත් හා අභිරූපණ ඉදිරිපත් කිරීම පිළිබඳ අංශයේ දී උපරිම ශීර්ෂ 02ක් සඳහා ඉදිරිපත් විය හැකිය.

5.5 1 කාණ්ඩයේ ඒක පාත්‍ර නාට්‍ය **(Mono-Drama)** සඳහා ඉදිරිපත් විය හැක්කේ ද 1 කාණ්ඩයේ වෙනත් නාට්‍ය නිෂ්පාදනයක් සඳහා ඉදිරිපත් වන පාසල්වලට පමණි.

5.6 මෙහි 2 කාණ්ඩයට අයත් වන යම් නාට්‍යයක් ඉදිරිපත් කරන යම් පාසලක් 3 කාණ්ඩයේ භූමිකා රංගන හා කතා පුවත් ඉදිරිපත් කිරීම පිළිබඳ අංශයෙහි නාට්‍යයක් තෝරා ගැනීම ආශ්‍රිත ශීර්ෂයකට ඉදිරිපත් වන විට, ඒ සඳහා 2 කාණ්ඩයේ දී තෝරාගත් නාට්‍යයම තෝරාගත නොහැකි ය.

5.7 භූමිකා රංගන හා කතා පුවත් ඉදිරිපත් කිරීම පිළිබඳ අංශයෙහි 3 කාණ්ඩයේ නාට්‍ය අතර ඇති යම් නාට්‍යයක් උළෙල පැවැත්වෙන වර්ෂයට පූර්වාසන්න වර්ෂ දෙකෙහි දී සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලේ 2 කාණ්ඩය සඳහා නිෂ්පාදනය කොට ජාතික වටයේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානයක් යම් පාසලක් විසින් ලබා ඇත් නම් එම පාසල්වලට ද නමින් 2 කාණ්ඩයෙන් ඉදිරිපත් වූ එම නාට්‍යය මෙවර 3 කාණ්ඩයෙහි අදාළ ශීර්ෂයක් සඳහා භාවිත කළ නොහැකි ය.

5.8 **ඉහත සඳහන් සහභාගීත්ව සීමාවන් ඉක්මවා අයදුම්පත් ඉදිරිපත් කිරීම උළෙලේ සංවිධාන හා පරිපාලන කටයුතු සඳහා බාධාවක් බැවින් එම සීමාවන් නොතකා සහ සීමාව ඉක්මවා අයදුම්පත් ඉදිරිපත් කරන පාසල් උළෙලේ කිසිදු ශීර්ෂයක් සඳහා ලියාපදිංචි කර නොගැනේ.**

5.9 අයදුම්පත් එවීම සඳහා චක්‍රලේඛයෙන් සඳහන් කෙරෙන අවසාන දිනයට හෝ ඊට පෙර වන විට රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙහි සඳහන් පරිදි විධිමත්ව අයදුම්පත් ඉදිරිපත් කළ පාසල් නාම ලේඛනය, **www.moe.gov.lk** දරන අධ්‍යාපන අමාත්‍යාංශීය වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධියට පත් කෙරේ. අවසාන දිනයට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගැනේ.

5.10 **1 කාණ්ඩයේ ශීර්ෂයන් සඳහා ඉදිරිපත් කරන නාට්‍යවල පිටපත් A4 කඩදාසිවල, සම්මත නාට්‍ය පිටපත් ආකෘතියට අනුව පිටුවේ අවකාශය බෙදා තබමින්, ෆොන්ට් 12 අක්ෂර ප්‍රමාණයෙන් පරිගණක යතුරු ලියනය කොට තිබීම අනිවාර්ය වේ. එසේ නොවන පිටපත් ප්‍රතික්ෂේප කෙරේ.**

5.11 උළෙලට ඉල්ලුම් කිරීමේ දී චක්‍රලේඛයේ අවසානයට උපලේඛන ගත කර ඇති A යන පොදු ඉල්ලුම්පත් ආකෘතිය පමණක් භාවිත කළ යුතු ය.

5.12 **ඉල්ලුම් කරන ශීර්ෂ සියල්ලම ඉහත A යන පොදු ඉල්ලුම්පත් ආකෘතියෙහි සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතු අතර ඒ ඒ ශීර්ෂ සඳහා වෙනම අයදුම්පත් නොඑවිය යුතු ය.**

5.13 ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඉතා පැහැදිලි අකුරින් එය සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

5.14 ඉහත ඉල්ලුම් පත්‍රය **2020 නොවැම්බර් 11** දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙහි පිටපතක් තම පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද **අනිවාර්යයෙන්ම** යැවිය යුතු අතර උළෙලට අයදුම් කළ බව සලකනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් අයදුම් කළේ නම් පමණි. මෙම උපදෙස්වලට පටහැනිව ලැබෙන ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

5.15 අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk දරන වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කෙරෙන උළෙලට අදාළ චක්‍රලේඛයේ මුද්‍රිත පිටපතක් සියලු පළාත්, කලාප කාර්යාලවලට එවනු ලැබේ. එය නිකුත් වූ විට අදාල පළාත් සහ කලාප සෞන්දර්ය විෂයභාර නිලධාරීන් එම චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස්වලට අනුකූලව තම පළාතේ/කලාපයේ පාසල්වලට අයදුම්කිරීමට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් පවත්වා මඟින් දැනුවත් කිරීම අපේක්ෂා කෙරේ.

5.16 තම කලාපයේ / පළාතේ පාසල් මේ සඳහා අයදුම් කිරීමේ ප්‍රගතිය දෛනික පදනමින් පිරික්සා බලා අදාළ නිලධාරීන්ට අවශ්‍ය කටයුතු සිදු කිරීම පහසු වනු පිණිස, අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබෙන **නිවැරදි** අයදුම්පත් පිටපත් විද්‍යුත් තැපැල් මාර්ගයෙන් අදාළ පළාත් දෙපාර්තමේන්තුවලට ද දෛනිකව යවනු ලැබේ.

5.17 සහභාගී වන සිසු සිසුවියන්ගේ නම් සහිත සවිස්තරාත්මක තොරතුරු, අදාළ පළාත් හෝ සමස්ත ලංකා වටයන්ට පූර්වයෙන් **නියම කරනු ලබන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු** ය. එම නියම කරනු ලබන අවස්ථාවේදී සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකරන පාසල්වලට අදාළ ඇගයීම් වටයට ඉදිරිපත් විය නොහැකි ය. මුල් අවස්ථාවේ දී A යන පොදු ඉල්ලුම්පත් ආකෘතියෙහි තමන් ඉදිරිපත් වන අංශයට සම්බන්ධ වන පුද්ගල සංඛ්‍යාව සඳහන් කළ යුතු වේ.

5.18 සපුරා සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේ දී නම්වල **මුල් අකුරු ඉංග්‍රීසියෙන්** ලිවිය යුතු ය.

5.19 මෙහි අංක 1.1.1, 1.2.1, 1.3.1 සහ 1.5.1 දරන ශීර්ෂයන් සඳහා නිෂ්පාදනය කරනු ලබන නාට්‍යවල ස්වහස්ත පිටපත් සහ අංක 1.4.1 අධ්‍යාපන විශේෂ රංග රංග සැලසුම් යෝජනාව අදාළ පාසලේ විදුහල්පති විසින්, **2020 නොවැම්බර් 11** දිනට පෙර පිටපත් **තුනකින්** යුතුව අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශයේ අධ්‍යක්ෂ වෙත **අනිවාර්යයෙන්ම** යොමු කළ යුතුය. ඉන් **එක් පිටපතක** පෙළ රචකයාගේ නම, අදාළ විදුහලේ විදුහල්පතිගේ නම, අත්සන හා නිල මුද්‍රාව සටහන් කළ යුතු ය. **අනෙක් පිටපත් දෙකෙහි කිසිදු ස්ථානයක, විදුහලෙහි හෝ පුද්ගලයකුගේ අනන්‍යතාවයක් හඳුනාගත හැකි කිසිවක් සටහන් නොවිය යුතුය.**

5.20 මෙම පිටපත් ද එවිය යුත්තේ, මෙහි අවසානයට ඇති A යන පොදු ආකෘති පත්‍රය පත්‍රයෙන් සම්පූර්ණ අයදුම් පත්‍රය සමඟ ම වන අතර වෙනම අයදුම්පත් නො එවා, පිටපත පමණක් එවා ඇති අවස්ථාවක දී එම පිටපත් ඇතුළත් කර නොගැනේ. අයදුම්පත් හා පිටපත් එවන ලියුම් කවරවල ඉහළ වම් කෙළවරෙහි **'සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2021'** යනුවෙන් සටහන් කළ යුතු ය.

5.21 අයදුම්පත් සහ නාට්‍ය පිටපත් එවිය යුතු ලිපිනය:

අධ්‍යාපන අධ්‍යක්ෂ,
සෞන්දර්ය අධ්‍යාපන ඒකකය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

5.22 උළෙලේ 1 කාණ්ඩයේ පළමු වටය වන පිටපත් සහ රංග සැලසුම් ඇගයීම් විනිශ්චය වටයක් වන බැවින් රාජ්‍ය නාට්‍ය **අනුමණ්ඩලය විසින් නිර්දේශිත, ජාතික මට්ටමේ නාට්‍ය හා රංග කලා විෂය විශේෂඥයින්ගෙන් හෝ අමාත්‍යාංශීය විශේෂ අනුමැතිය සහිත විෂය විශේෂඥයන්ගෙන් සමන්විත ඇගයීම් මණ්ඩලයක් මගින්** එම කටයුත්ත සිදු කෙරෙන අතර, දෙන ලද කාල සීමාව තුළ ඉහත ලිපිනයට විධිමත්ව නො එවන නාට්‍ය පිටපත් මොනම හේතුවක් නිසාවත් ඇගයීම සඳහා භාර නො ගැනේ.

5.23 නිර්දේශිත නාට්‍ය ජවනිකා අයත් 02 කාණ්ඩයේ ශීර්ෂයන්ට අදාළව, තෝරාගත් නාට්‍ය කොටස පිළිබඳ වචන 100ක පමණ සාරාංශයක් නම අයදුම්පත සමඟ එවිය යුතු වේ.

5.24 පිටපත් ඇගයීමට ලක් කළ 1 කාණ්ඩයේ නාට්‍ය පිටපත් හා රංග සැලසුම්, ඇගයීම් මණ්ඩල නිර්දේශ අනුව නිෂ්පාදනය කිරීමට හෝ සංශෝධන සහිතව නිෂ්පාදනය කිරීමට හෝ මෙම අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශය වෙතින් ලිඛිතව අදාළ පාසල වෙත අවසර ලබා දේ. ඉන් පසු එම නාට්‍යය පළාත් උළෙලට ඉදිරිපත් කළ යුතු ය.

5.25 2018 වර්ෂයේ දී නිවේදනය කළ ආකාරයට ම, මෙම වර්ෂයේ පටන් ඉදිරියට මීට පෙර කිසිදු වෙනත් නාට්‍ය උළෙලකට හෝ තරගයකට ඉදිරිපත් නොකළ නව නිර්මාණ පමණක් මේ සඳහා ඉදිරිපත් කළ යුතු වේ. අධ්‍යාපන අමාත්‍යාංශය එළැඹී යම් සුවිශේෂ තීරණයක දී හැර, අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ වෙනත් ආයතනවල නාට්‍ය උළෙලවලට හෝ තරගවලට මීට පෙර ඉදිරිපත් කළ නාට්‍යවල නව නිෂ්පාදන හෝ නාට්‍යවල පිටපත් සංශෝධනය කොට හෝ මේ සඳහා ඉදිරිපත් කළ නොහැකි

ය. සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලට ඉදිරිපත් කිරීමෙන් පසුව වෙනත් නාට්‍ය උළෙලකට හෝ තරගයකට ඉදිරිපත් කිරීමේ බාධාවක් නොමැත.

5.26 සියලු කාණ්ඩවල නිර්මාණවල අධ්‍යක්ෂණය / පුහුණු කිරීම සහ අනෙකුත් ආනුෂංගික අංශ සඳහා එක් කණ්ඩායමකින් ඉදිරිපත් විය යුත්තේ අදාළ අංශයේ ප්‍රධාන වගකීම දරන ගුරු භවතා හෝ සිසු දරුවා/දැරිය පමණි.

5.27 ඉහත කොන්දේසිවලට පටහැනිව හෝ ඒවා නොතකා අයදුම්පත් ඉදිරිපත් කිරීම අදාල විදුහල් නොසැලකිලිමත් බවක් සේ සලකන බැවින් එවන් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 6. උළෙල අවස්ථා

6.1 මෙම උළෙල අවස්ථා 03 කින් සමන්විත වේ.

- පිටපත් වටය — 1 කාණ්ඩයේ ස්වතන්ත්‍ර නාට්‍ය තේරීම සඳහා
- පළාත් උළෙල: — 1 කාණ්ඩයේ පිටපත් ඇගයීමට ලක් කරන 1.1.1, 1.2.1 හා 1.3.1 තේරීම්වල හොඳම පිටපත් 05 අයත් නිෂ්පාදන සහ 3 කාණ්ඩයට ඉදිරිපත්වන අදාල පළාතේ පාසල් නියෝජනයන්
- ජාතික උළෙල: — පළාත් වටයේ දී ප්‍රථම ස්ථානයට පත් වූ හෝ පසුව ම අවසාන වටයට කැඳවන පාසල් නියෝජනයන් සහ 1 කාණ්ඩයේ ඒ ඒ නාට්‍ය තේරීමයන් අතරින් කලාත්මක හා ගුණාත්මක ප්‍රමිතිය අතරින් ඉහළම මට්ටමේ පවතින බවට ජූරියේ විශේෂ නිර්දේශය මත එක් තේරීමයකින් තෝරා ගන්නා පාසල් දෙකක නියෝජනයන් (එක් එක් තේරීමයක් සඳහා පළාතකින් එක බැගින් නාට්‍ය 09ක් සහ ජූරියේ විශේෂ නිර්දේශිත නාට්‍ය 02ක් වශයෙන් උපරිම නාට්‍ය 11කි.).

6.2. 1 කාණ්ඩයට අයත් සියලු නාට්‍ය හා 3 කාණ්ඩයට අයත් නිර්මාණ පළාත් උළෙල සඳහා ඉදිරිපත් විය යුතු අතර එයින් ජාතික උළෙල සඳහා සුදුසුකම් ලබා ගත යුතු වේ. 2 කාණ්ඩයේ නිර්මාණ ද පළාත් උළෙලට වේදිකාගත කළ යුතු අතර ජාතික වටයට ඉදිරිපත් වන සංඛ්‍යාව 2 කාණ්ඩයේ නිර්මාණ සම්බන්ධයෙන් වෙනෙක් අනුගමනය කළ ආකාරයට ම තේරීමයට අයදුම් කළ සමස්ත පාසල් සංඛ්‍යාව අනුව තීරණය කෙරේ.

6.3. නිර්මාණවල ගුණාත්මක භාවය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන් ම දුර්වල පිටපත් නිෂ්පාදනය කිරීම මගින් සිදු විය හැකි ද්‍රව්‍යමය, හා මූල්‍යමය සම්පත් හානිය වලක්වා ඒවා වඩාත් සඵලදායී නිර්මාණාත්මක ප්‍රයත්නයන් කෙරෙහි යෙදවීමට අවකාශ සැලසීම සඳහා, 1 කාණ්ඩයට අයත් තේරීම සඳහා පිටපත් / රංග සැලසුම් ඇගයීම විනිශ්චය වටයක් ලෙස පැවැත්වෙන අතර එම තේරීම්වලට යම් පළාතකින් අයදුම් කර ඇති පිටපත්වලින් / රංග සැලසුම්වලින් හොඳම 05 පමණක් පළාත් ඇගයීම සඳහා තෝරා ගැනේ. එසේ තෝරා ගැනෙන පාසල් 05 අතරින් යම් පාසලක් පළාත් වටයට ඉදිරිපත් නො වේ නම් අනුක්‍රමයෙන් 06 වන 07 වන ස්ථානයන්ට අවස්ථාව හිමි වේ. එම නිසා නම් පිටපත නිෂ්පාදනයේ දී ඉදිරිපත් කිරීමට අපේක්ෂිත කලාත්මක ප්‍රමිතිය සහ ස්වභාවය පිළිබඳ විස්තර විනිශ්චය මණ්ඩලයට තහවුරු කළ හැකි පරිදි පිටපත සමඟ ලබා දිය යුතු ය. (අතිශයින්ම නොසැලකිලිමත් ලෙස සකසා පිටපත් එවන විදුහල් උළෙලෙන් ඉවත් කෙරේ).

6.4 පිටපත් සම්පාදන අවදියේ දී තෝරා නොගන්නා පිටපත්වල පිටපත් රචකයන් සඳහා පිටපත් රචනය සඳහා විශේෂ වැඩසටහනක් උළෙලේ අවසන් වටයෙන් පසුව එම වසර තුළ පවත්වා එම පිටපත සංවර්ධනය කිරීමට හෝ නව පිටපතක් ඉදිරි වසර සඳහා රචනය කිරීමට අවශ්‍ය ප්‍රතිපෝෂණය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙනු ඇත.

6.5 1 කාණ්ඩයේ ඒක පාත්‍ර නාට්‍ය පිළිබඳ තේරීමය පළාත් උළෙල සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන්නේ, ඒ සඳහා පූර්ව කොන්දේසිය වන, 1 කාණ්ඩයේ අනෙක්

නාට්‍ය නිෂ්පාදනය පළාත් උළෙළ සඳහා වේදිකා ගත කරන්නේ නම් පමණි. යම් හෙයකින් එම නාට්‍ය නිෂ්පාදනය ඉදිරිපත් නොකරන්නේ නම් උක්ත ශීර්ෂයට ද ඉදිරිපත් විය නොහැකි ය.

6.6 3 කාණ්ඩයේ අභිනය රංගන, කතා පුවත් හා අභිරූපණ පළාත් උළෙළ සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන්නේ, ඒ සඳහා පූර්ව කොන්දේසිය වන, 1 කාණ්ඩයේ නිර්මාණය පළාත් උළෙළ සඳහා ද 2 කාණ්ඩයේ නිර්මාණ ජාතික උළෙළ 1 වටය සඳහා ද වේදිකා ගත කරන්නේ නම් පමණි. යම් හෙයකින් ජාතික වටයට 1 හෝ 2 කාණ්ඩයේ නිර්මාණය ඉදිරිපත් නොකරන්නේ නම් 3 කාණ්ඩය සඳහා ද ඉදිරිපත් විය නොහැකි අතර ඉදිරිපත් කෙරුණු අංග ද ඉවත් කරනු ලැබේ.

6.7 යම් නාට්‍ය ශීර්ෂ සඳහා අයදුම් කොට ඇති ප්‍රමාණය අනුව යම් ශීර්ෂයක් හෝ ශීර්ෂ කිහිපයක් සඳහා තදාසන්න පළාත් දෙකක හෝ කිහිපයක පළාත් ඇගයීම්, එක් ස්ථානයක වේදිකාගත කොට වෙන් වෙන් වශයෙන් පළාත් පාදකව ඇගයීමට ලක් කිරීමට කටයුතු යෙදෙනු ඇත.

6.8 පළාත් උළෙළ අදාළ පළාත භාර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ මෙම අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යක්ෂ එක්ව සංවිධානය කළ යුතු අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට සහාය වීම පළාතේ සෞන්දර්ය හෝ නාට්‍ය හා රංග කලා විෂය භාර අධ්‍යක්ෂවරයාගේ හෝ අධ්‍යක්ෂවරියගේ වගකීම වේ.

6.9 පළාත් උළෙළට ඉදිරිපත් කළ සිසුන්ම එම ශීර්ෂවලින් සමස්ත ලංකා මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි යම් ගැටලුවක් පළාත් උළෙළ මට්ටමේ දී මතු වුවහොත්, මෙහි කොන්දේසි උල්ලංඝනය නො වන පරිදි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන්, සමස්ත ලංකා මට්ටමේ දී මෙම අමාත්‍යාංශයේ ලේකම්ගෙන් උපදේශකත්වය හා පූර්ව ලිඛිත අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතු ය.

6.10 ජාතික උළෙළ 2021 මැයි මස 08 සහ 09 දෙදින පැවැත්වෙන අතර පළාත් වටයන් 2021 වර්ෂයේ පළමු වාරය තුළ දී පැවැත්වේ.

6.11 සෑම උළෙළ අවස්ථාවක දී ම සිසුන් ඉදිරිපත් කළ යුත්තේ උළෙළට ඉදිරිපත්වන පාසලේ විදුහල්පතිගේ අනුමැතිය මත පමණක් වන අතර ආනුෂංගික අංගවල ශිල්පීය අවශ්‍යතාවන් සඳහා වෙනත් පාසලකින් සිසුන් හෝ ගුරුවරුන් යොදවා ගැනීමේ දී ද අදාළ විදුහල්පතිවරුන්ගේ අන්‍යොන්‍ය එකඟතාවය හා අනුමැතිය මත එය සිදුවිය යුතු ය.

6.12 ඒකල, යුගල හෝ සමූහ ශීර්ෂයකට සහභාගී වන යම් සිසුවකු, සිසුවියක හෝ එම අංගය පුහුණු කිරීමට දායක වූ ගුරු භවතකු අයත් පාසලක් පළාත් මට්ටමට පෙනී සිට සමස්ත ලංකා මට්ටමට සුදුසුකම් ලබා ඇති අවස්ථාවක දී, සමස්ත ලංකා අවස්ථාව පැවැත්වීමට පෙර එම සිසුවාට, සිසුවියට හෝ ගුරු භවතාට වෙනත් පාසලකට ඇතුළත් වීමට හෝ ස්ථාන මාරු වීමට සිදු වූ විටෙක, මෙම වසර සඳහා පමණක් තමා මුලින්ම පළාත් මට්ටමට පෙනී සිටි පාසල නියෝජනය කිරීමට ඉඩ ලබා දිය යුතු වේ.

## 7. නාට්‍ය පෙළ හා අන්තර්ගතය

7.1 කර්තෘ මූලාශ්‍රයන් සඳහන් කොට ගත්ත ද සියලුම නාට්‍ය පෙළ රචනා ස්වතන්ත්‍ර නිර්මාණ විය යුතුය. (02 කාණ්ඩයේ ශීර්ෂ හැර).

7.2 මෙම උළෙළ සඳහා නිර්මාණය කරන සහ නිෂ්පාදනය කරන නාට්‍යවල තේමා / කතා වස්තූන් / ගී පද මාලා / දෙබස් / නාට්‍ය පෙළ ආදිය ජාති, ආගම්, කුල භේදවලට හා වෙනත් සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර, එවන් අදහස් ගම්‍ය වන පරිදි අර්ථකථනය නො කළ යුතු ද වේ. තවද, තමන් අයත් වන හෝ නියෝජනය කරන ජාති, ආගම්, සංස්කෘතික හා දේශපාලනික මතිමතාන්තර හෙළුකොටදක්වන කිසියම් සමාජ කොට්ඨාසයක් අපහසුවට ලක් විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම්වලින් වැළකිය යුතු ය.

7.3 සියලු නිර්මාණයන් පාසල් සිසුනට උචිත, පාසල් පද්ධතියේ පිළිගත් චර්යාධර්ම හා නො කැඩෙන ඒවා විය යුතු අතර අවර ගණයේ භාෂා ව්‍යවහාරයන්ගෙන් තොර විය

යුතු ය. 02 කාණ්ඩයේ ශීර්ෂයන්ට අදාළ පෙළ තෝරා ගැනීමේ දී ද, ඉහත කරුණ පිළිබඳව මනාවින් සැලකිලිමත් විය යුතු වේ.

7.4 අන්තර්ගතය අතින් ඉහත කොන්දේසි හා අනුකූල නො වන නාට්‍ය පිටපත් පළමු වටයේ දී ම උළෙලින් ඉවත් කරනු ලැබේ.

7.5 1 කාණ්ඩයේ නාට්‍ය නිෂ්පාදනවල දී අදාල පාසලේ විදුහල්පති, ගුරුභවතකු හෝ ශිෂ්‍යයකු විසින් නාට්‍ය පිටපත රචනා කළ යුතුය.

## 8. ඇගයීම

8.1 පිටපත් වටය, පළාත් වටය සහ සමස්ත ලංකා උළෙළ යන මට්ටම්වල නාට්‍ය ඇගයීම් සඳහා ඇගයීම් මණ්ඩල, ශ්‍රී ලංකා කලා මණ්ඩලයෙහි රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය විසින් නිර්දේශිත, ප්‍රවීණ සම්පත්දායක සංචිතයක් අතරින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පත් කෙරෙනු ඇත.

8.2 නාට්‍ය නිෂ්පාදනයක් ඇගයීම යනු එක් නිර්මාණයක් ඇතුළත එකිනෙකට වෙනස් ක්ෂේත්‍රයන් 10ක් පමණ සුවිශේෂ වශයෙන් සැලකිල්ලට ගෙන ඇගයීමට සිදුවන සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් මෙම උළෙලේ කිසිදු අවස්ථාවක දී ඇගයීම් මණ්ඩල සහ ඇගයීම් ක්‍රියාවලිය ගණිතමය / සංඛ්‍යාත්මක සාධක මත පදනම් නොකෙරේ. ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ අවශ්‍යතාවන් පාදකව, ජාතික වටයේ දී අවම වශයෙන් තුනක් උපරිම වශයෙන් හයක් අතර සංඛ්‍යාවකින් යුතුව ඇගයීම් මණ්ඩල පත් කෙරෙන අතර, යම් ශීර්ෂයකට පත් කෙරෙන ඇගයීම් මණ්ඩලය ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය එකඟතාව මත ලබා දෙන ඇගයීම් සමඟින්, අවසාන විනිශ්චය වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් භාර ගනු ලැබේ.

8.3 භූගෝලීය වශයෙන් මෙරට නාට්‍ය කලාවේ විෂම ව්‍යාප්තිය අනුව, සහ රජය විසින් පවත්වන අන් සියලු ප්‍රධාන පෙළේ නාට්‍ය උළෙලවල සහ තරගවල අනුගමනය කෙරෙන ක්‍රියාවලිය අනුව, මෙම උළෙලේ ද පළාත් ඇගයීම එක් පොදු ඇගයීම් මණ්ඩලයක් මගින් සිදු කෙරේ. පළාත් ඇගයීමට ලක් කෙරෙන 1, 2 හා 3 කාණ්ඩයේ සියලු නිර්මාණ ඒවායේ ගුණාත්මක මට්ටම අනුව පහත පරිදි ශ්‍රේණිගත කෙරේ. ජාතික අදියරට පෙර වඩාත් හොඳින් තම නිර්මාණය සකස් කර ගැනීම දිරි ගැන්වීම සඳහා මෙම වර්ගීකරණය සිදු කෙරේ. (2 කාණ්ඩයේ පළාත් ඇගයීමේ දී පහත C ශ්‍රේණියේ නිර්මාණ ජාතික වටය සඳහා ඉදිරිපත් නො කෙරේ).

A ශ්‍රේණිය - හොඳ නිෂ්පාදනයකි
B ශ්‍රේණිය - සාමාන්‍ය මට්ටමේ නිෂ්පාදනයකි
C ශ්‍රේණිය - දුර්වල නිෂ්පාදනයකි

8.4 පළාත් මට්ටමේ දී අංග රචනය, රංග වස්ත්‍රාභරණ සහ පසුතල නිර්මාණය යන ආනුෂංගික අංග ඇගයීමට බඳුන් නො කෙරේ. ජාතික උළෙලට තේරී පත්වන හෝ ඉදිරිපත්වන නාට්‍ය අංග, එයට ඉදිරිපත් කිරීමේ දී නිර්මාණයට අදාළව ආනුෂංගික අංග භාවිත කළ යුතුය.

8.5 මෙම උළෙලේ ඇතැම් ශීර්ෂයන් කිහිපයක් සඳහා අවශ්‍යතාම පටිගත කළ සංගීතය භාවිතයට හා ශබ්ද සංයෝජනයන් භාවිතයට ඉඩ ලබා දේ. එහෙත් එම සංගීත, ශබ්ද සංයෝජන උපාංගයන් සඳහා නාට්‍ය වේදිකාගත කෙරෙන ශාලාවල විදුලිය සැපයුමෙන් විදුලිය සැපයීමට උළෙළ සංවිධායකයන් බැඳී නොමැති බැවින් අදාල පාසල් විසින් යෝග්‍ය විකල්පයක් සොයා ගත යුතු ය.

8.6 නාට්‍යවල ගින්දර භාවිතය තහනම් වන අතර වේදිකා ආලෝක උපකරණ ගෙනැවිත් සවි කිරීම හෝ දුම යන්ත්‍ර භාවිතය ද සපුරා තහනම් ය.

8.7 ජාතික වටයේ දී අදාල නිර්මාණය වේදිකාගත කරන මධ්‍යස්ථානයට පිටතින් අංග රචනය සිදු කරගෙන පැමිණීම සපුරා තහනම් වන අතර එවැන්නක් සිදු කළ බව හෝ ඉහත 4.8 කොන්දේසිය උල්ලංඝනය වී ඇති බව අනාවරණය වූ අවස්ථාවක දී අංග රචනය පිළිබඳ ඇගැයීමෙන් එම විදුහල ඉවත් කෙරේ.

8.8 ජාතික වටයේ දී පසුතලයක් සවි කිරීම සහ සවි කොට තිබූ පසුතලයක් ඉවත් කිරීම විනාඩි 10ක කාලයක් තුළ සිදු කළ යුතු ය. යම් ශීර්ෂයක පූර්වයෙන් ඉදිරිපත් වන පාසල ද පසුතලය සවි කළ යුත්තේ ඇගයීම් මණ්ඩලය අසුන් ගත් පසුව ඔවුන් ඉදිරිපිට දී ය. නැතහොත් අදාල ඇගයීම් මධ්‍යස්ථානයේ ප්‍රධාන සංවිධායක හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ බලය ලත් නියෝජිතයකු ඉදිරිපිට දී ය.

8.9 මේ සෑම අවස්ථාවක දීම ප්‍රධාන තිරය විවෘතව තබා ඇගයීම් මණ්ඩලයට සහ අන් සැමට පෙනෙන පරිදි පසුතල සවි කිරීම සහ ඉවත් කිරීම සිදු කළ යුතු ය. දී ඇති කාල සීමාව තුළ ඉතා පහසුවෙන් සවි කළ හැකි අයුරින් ද, ආරම්භයට නාට්‍යය තුළ භාවිත කළ හැකි අයුරින් ද සහ අවසානයේ දී ඉතා කඩිනමින් ගලවා ඉවත් කළ හැකි අයුරින් ද පසුතලය සකස් කිරීමේ නිර්මාණාත්මක අභියෝගය අදාල විදුහල සතු වේ. අදාල කාල සීමාව තුළ ඉවත් කර නොගන්නා සහ සවි කර නොගන්නා පසුතලයන් පසුතල නිර්මාණ ඇගයීමෙන් ඉවත් කරනු ලැබේ.

8.10 ඕනෑම උළෙල අවස්ථාවට ඉදිරිපත් වන නාට්‍ය ඇගයීමේ දී, 3 කාණ්ඩයේ ශීර්ෂයන් සඳහා හැර අන් සියලු ශීර්ෂයන්ට අයත් නාට්‍ය වේදිකා ගත කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුත්තේ, නාට්‍යයක් වේදිකා ගත කිරීම සඳහා යෝග්‍ය ප්‍රොසීනියම් වේදිකාවක් සහිත රංග ශාලාවක් තුළ පමණි. (1.4.1 ශීර්ෂය හැර)

8.11 ඕනෑම උළෙල අවස්ථාවක දී වුව ද, එකකට වඩා වැඩි ඇගයීම් මණ්ඩල සංඛ්‍යාවක නාට්‍ය ඇගයීමේ කටයුතු සිදු කෙරෙන්නේ නම් එම ඇගයීම් මණ්ඩලවල පිහිටීම හා අදාල මණ්ඩලවලට ඉදිරිපත් කෙරෙන ශීර්ෂයන් පිළිබඳව තොරතුරු ඇතුළත් කාල සටහනක් සකස් කර අදාල පාසල් වෙත ලිඛිතව ලබා දීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු ය.

8.12 කිසිදු ශීර්ෂයක් සඳහා සම ස්ථාන ලබා නො දේ. ප්‍රථම ස්ථානයට සහ පූර්වයේ නිර්දේශයන්ට අතිරේකව, පළාතකින් යම් ශීර්ෂයකින් අමතර නාට්‍ය සම්මාන ලංකා මට්ටමට තෝරා නොගැනේ.

8.13 අවසන් සාධන මට්ටමට ළඟා වී නොමැති බවට ඇගයීම් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නාට්‍ය හෝ නාට්‍ය අංග, පළාත් මට්ටමින් ජාතික මට්ටමට හෝ ජාතික මට්ටමේ සම්මානයන් සඳහා තෝරා නො ගනු ඇත.

8.14 මෙහි ශීර්ෂ යටතේ දක්වා ඇති කොන්දේසි අතර ඇති කාලයට, සහභාගී විය හැකි පුද්ගල සංඛ්‍යාවට සහ සහභාගී විය හැකි ශ්‍රේණි පරාසයන්ට අදාල කොන්දේසීන්ගෙන් එකක් හෝ කිහිපයක් උළෙලේ ඕනෑම අවස්ථාවක දී උල්ලංඝනය වූ විටෙක එම වැරදි සඳහා දරුවන්ට වන්දි ගෙවීමට ඉඩ තබනු නොලැබේ. තම නිර්මාණය චක්‍රලේඛයට අනුකූලව ඉදිරිපත් කිරීම නිර්මාණයට දායක වන ගුරුභවතුන්ගේ සාමූහික වගකීමක් වන බැවින් අදාල ශීර්ෂයෙන් එම විදුහල නියෝජනය කළ සියලුම ගුරු භවතුන්ගේ සහතික අයිතිය අවලංගු කරනු ලැබේ.

8.15 ඉහත කරුණුවලට අදාලව යම් වංචනික ක්‍රියාවක් සිදුව ඇතැයි උළෙලෙහි ඕනෑම අවස්ථාවක දී හෝ උළෙලට පසුව හෝ අනාවරණය වුවහොත්, වගකිවයුතු ගුරු භවතුන්ට එරෙහිව විනය කාර්ය පටිපාටිය අනුව කටයුතු කොට, ඉදිරි කිසිදු අවස්ථාවක දී පාසල් පද්ධතිය නියෝජනය කරමින් කිසිදු උළෙලකට හෝ තරගයකට නාට්‍ය ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කිරීම ඇතුළුව නිර්දේශිත අනෙකුත් විනය පියවරයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

8.16 කාල සටහනේ සඳහන්ව නියමිත කාලයට පෙර අදාල ඇගයීම් මණ්ඩලය පිහිටි විදුහල වෙත පැමිණ සූදානම් වී, කාල සටහන අනුව සංවිධායක මණ්ඩලය විසින් තම නිර්මාණය වේදිකා ගත කිරීමට කැඳවා සිටින වේලාවට පෙර ලියාපදිංචි වීම අදාල විදුහලේ වගකීමකි. කාල සටහනට අනුව තම විදුහලට නියමිත වාරයෙන් ලබා දී ඇති වේලාවට අදාල මණ්ඩලයට වාර්තා නොකරන ඕනෑම පාසලක් උළෙලට සහභාගී නොවන සේ සලකා එම අංශයට ඉදිරිපත්ව සිටින අනෙකුත් සහභාගී වන්නන් අපහසුවට පත් වීම වැළැක්වීමට කටයුතු කෙරෙනු ඇත.

8.17 ජාතික වටය සඳහා සහභාගීවන පාසල්වලට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නේවාසික පහසුකම් ලබා නො දේ. නේවාසික පහසුකම් අවශ්‍ය පාසල්වලට පහසුවක්

වශයෙන්, එම සහනුකම් ලබා ගත හැකි පාසල් පිළිබඳව තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් සිදු කෙරේ.

8.18 ජාතික හා පළාත් ප්‍රතිඵල, අදාළ වර්ෂය පවත්වන දිනයේදීම ප්‍රකාශයට පත් කරනු ලැබේ.

## 9. විනය

9.1 එක් එක් අවස්ථාවට සහභාගී වීම සඳහා මධ්‍යස්ථානවලට කැඳවාගෙන එන සිසුන්ගේ ආරක්ෂාව, හැසිරීම, විනය හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ සංවිධායක භාර ගුරුවරුන්ගේ විශේෂ අවධානය යොමු විය යුතුය.

9.2 සිසුන්ගේ භාරකාරත්වය ගුරුමහතුන්ට ද, සිසුවියන්ගේ භාරකාරත්වය ගුරුමහත්මීන්ට ද පැවරේ.

9.3 කිසියම් අයථා සිදුවීමක් සිදුවුවහොත් ඒ සඳහා භාරකරුවන් වගකීමට බැඳේ. උළෙල හා සම්බන්ධ කිසිදු අවස්ථාවක් සඳහා දෙමාපියන් සහභාගී කර නොගත යුතුය.

9.4 **මෙම උළෙල සඳහා අයදුම් කොට ඉදිරිපත්වන සියලුම පාසල් හා අනෙකුත් අදාළ පාර්ශවකරුවන් උළෙලේ සෑම අවස්ථාවක දීම මෙහි සඳහන් සියලුම නීති රීති හා විධිවිධාන අනිවාර්යයෙන්ම පිළිපැදීමට බැඳී සිටින බවත්, ඇගයීම් මණ්ඩලයේ තීරණය කොන්දේසි විරහිතව පිළිගැනීමට බැඳී සිටින බවත් සලකනු ලැබේ.**

9.5 **යම් පාසලක් අයදුම්පත් එවීමේ දී ම විනිශ්චය පිළිගැනීමට බැඳී සිටින හෙයින් විනිශ්චය පිළිබඳ අභියාචනා ඉදිරිපත් නො කළ යුතු අතර එවැනි අභියාචනා භාර නොගැනේ.**

9.6 සංවිධාන කටයුතුවලට බාධා පැමිණෙන අයුරින් හෝ වෙනත් නුසුදුසු ක්‍රියාවන් සිදුකරමින් හෝ හැසිරෙන ගුරුවරුන් හා සිසුන් [illegible] සඳහා විනයානුකූලව පියවර ගනු ලැබේ.

9.7 මෙම උළෙලේ කොතැම අවස්ථාවකදීවත් තම පාසලේ කටයුතු ආවරණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අවසරයක් නොමැති ජනමාධ්‍යවේදීන් හෝ ඡායාරූප ශිල්පීන් කැඳවාගෙන ඒම තහනම් වේ.

9.8 අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජකාරියක් වන මෙම උළෙලේ සෑම අවස්ථාවක දී ම යම් විදුහලක් ආශ්‍රිතව රාජකාරී ගනුදෙනු සිදු විය යුත්තේ අදාළ විදුහලේ විදුහල්පතිවරයාත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් සෞන්දර්ය අධ්‍යක්ෂවරයාත් අතර පමණි. තම පාසලේ වෙනත් පාර්ශවයන් එම රාජකාරී ගනුදෙනුවලට මැදිහත් නොකරගත යුතු අතර, අධ්‍යාපන පද්ධතියෙන් පරිබාහිර පාර්ශවයන් මෙම රාජකාරී කටයුතු සඳහා මැදිහත් කර නොගැනීමේ වගකීම ද අදාළ පාසලේ විදුහල්පති වෙත සෘජුවම පැවරේ.

9.9 ජාතික උළෙල අදියරවල කාල සටහන් ලබා දීම, කොළඹ දී පැවැත්වෙන පූර්ව උපදෙස් රැස්වීමක දී සිදු කෙරෙනු ඇති බැවින් එයට සහභාගී වීම අනිවාර්ය වේ. එම රැස්වීමේ දී ලබා දෙන "විදුහල්පති විශේෂ ප්‍රකාශය" නම් ආකෘති පත්‍රය සම්පූර්ණ කර විදුහල්පතියේ අත්සන සහිතව නාට්‍යය ඉදිරිපත් කරන අවස්ථාවේ දී ලබා නොදෙන පාසල්වලට නාට්‍ය වේදිකාගත කිරීමට ඉඩ ලබා නොදේ.

9.10 **පාසලකට මෙම උපදෙස් පරිශීලනය කිරීමට නොහැකි වීම හෝ නොකිරීම නිදහසට කරුණක් නොවේ. ඉන් දරුවන්ට සිදුවිය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵලයක් ලෙස සලකා අදාළ වගකිව යුතු පාර්ශවයන්ට විරුද්ධව පියවර ගනු ලැබේ.**

## 10. අනන්‍යතාව තහවුරු කිරීම

10.1 අනන්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය වූ විටෙක සෑම සහභාගිවන්නෙකුම පිළිගත් හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීමට, සෑම අවස්ථාවකදීම සූදානමින් සිටිය යුතුය.

10.2 ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා සම්බන්ධ විදුහල්පතිවරයා සහතික කළ ශිෂ්‍ය නාමලේඛනයක් අනන්‍යතා සහතිකයක් ලෙස පිළිගැනේ.

10.3 ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත නොමැති සිසුන්ගේ අත්සන සහිත ඡායාරූපය අදාළ විදුහල්පති විසින් අත්සන් කොට අදාළ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාපයේ සෞන්දර්ය හෝ වෙනත් විෂය අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂවරියක විසින් සහතික කොට තිබිය යුතුය.

10.4 අනන්‍යතාව තහවුරු කිරීමට අපොහොසතුන් වේදිකාවෙන් ඉවත් කිරීමට සිදුවනු ඇත.

## 11. කුසලතා සම්මාන සහ සහතික පත් පිරිනැමීම

11.1 පළාත් මට්ටමින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුනට සහතික පත් පිරිනැමීමේ වැඩ පිළිවෙළක් පළාත් මට්ටමෙන් යොදා ගතයුතුය. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා මෙම අමාත්‍යාංශය මගින් සහතික පත් පිරිනමනු ලැබේ.

11.2 ඒ ඒ සිරසයන්හි සුවිශේෂතාවයන්ට අදාළ වන පරිදි පහත අංශයන් සඳහා සහතික පත් පිරිනැමේ.

- හොඳම නිෂ්පාදනය 1, 2 හා 3 ස්ථාන
- හොඳම අධ්‍යක්ෂණය
- හොඳම නාට්‍ය පෙළ රචනය
- හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා 1, 2 හා 3 ස්ථාන (1 හා 2 කාණ්ඩ සඳහා)
- හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යාව 1, 2 හා 3 ස්ථාන (1 හා 2 කාණ්ඩ සඳහා)
- හොඳම අංග රචනය (1 කාණ්ඩයේ ඒකපාත්‍ර නාට්‍ය හැර අනෙකුත් නාට්‍ය සඳහා)
- හොඳම රංග වස්ත්‍රාභරණ නිර්මාණය (1 කාණ්ඩයේ ඒකපාත්‍ර නාට්‍ය හැර අනෙකුත් නාට්‍ය සඳහා)
- හොඳම වේදිකා පසුතල නිර්මාණය (1 කාණ්ඩයේ ඒකපාත්‍ර නාට්‍ය හැර අනෙකුත් නාට්‍ය සඳහා)
- හොඳම සංගීත නිර්මාණය / හොඳම සංගීත - ශබ්ද සංයෝජනය (3 කාණ්ඩය හැර)
- හොඳම රංග විතානය (1 කාණ්ඩයේ ඒකපාත්‍ර නාට්‍ය හැර අනෙකුත් නාට්‍ය සඳහා)
- හොඳම වේදිකා පරිපාලනය (1 කාණ්ඩයේ ඒකපාත්‍ර නාට්‍ය හැර අනෙකුත් නාට්‍ය සඳහා)
- හොඳම භූමිකා රංගනය / කතාන්දර කථනය / අභිරූපණය 1,2,3 ස්ථාන (3 කාණ්ඩය සඳහා)
- ඇගයීම් මණ්ඩලයේ විශේෂ කුසලතා ඇගයීම

11.3 භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා සහ ශිෂ්‍යාව තෝරා ගැනීමේ පදනම වනුයේ නිරූපිත භූමිකාවේ ස්ත්‍රී/පුරුෂ භාවය නොව, නළුවාගේ/නිළියගේ ස්ත්‍රී/පුරුෂ භාවය ය.

මෙහි සඳහන් නොවන කරුණක් ආශ්‍රිත අවසාන තීරණය රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු ය.

# අදාළ ශීර්ෂ සහ ශීර්ෂ අංක

## 1 කාණ්ඩය – කෙටි නාට්‍ය නිෂ්පාදන

### 1.1. ළමා ප්‍රේමාත්මක නාට්‍ය

ළමා ලෝකය ප්‍රේමා කොටගත් සහ ළමා ප්‍රේක්ෂකාගාරයක් අරමුණු කොටගත් නාට්‍ය නිර්මාණයක් විය යුතු ය. එය ළමයාගේ වයස හා බුද්ධියට යෝග්‍ය වන ලෙස සකස් වූ නිර්මාණාත්මක වූ ද, සෞන්දර්යාත්මක වූ ද ක්‍රියාකාරකම්ය. විවිධ වයස්වල ළමයින් සහභාගී කරගනිමින් සමූහව පොදුවේත්, පෞද්ගලිකවත් රස විඳිය හැකි, පාසල් පද්ධතියට ගැළපෙන්නා වූ සාමූහික නිර්මාණයන් මෙ මගින් අපේක්ෂිත ය.

#### 1.1.1 විවෘත අංශය

- 1 සිට 13 ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන්ට සහභාගී විය හැකි ය.
- ළමා ප්‍රේක්ෂකාගාරයක් අරමුණු කොටගෙන නිර්මාණය කළ යුතු ය.
- රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- නාට්‍ය නිර්මාණය සඳහා සුදුසු ශෛලියක් යොදා ගත හැකිය.
- සජීවී සංගීතය පමණක් භාවිත කළ හැකි ය.
- කාලය උපරිම විනාඩි 25 ක් විය යුතුය.

### 1.2. කෙටි නාට්‍ය

නාට්‍යය රඟ දැක්වීමේ කාලය කෙටි වීමේ අරුතින් කෙටි නාට්‍ය ලෙස කිසි සේත්ම නොගැනෙන මෙම නිර්මාණාත්මක ප්‍රයත්නයේ දී, ජීවිතය තුළින් උකහා ගත හැකි අනේකවිධ අත්දැකීම් හා නාට්‍යමය අවස්ථාවන්, අභියෝග පුබල සහ සාරසංක්ෂිප්ත නාට්‍යමය අත්දැකීම් ලෙස කලාත්මකව ප්‍රකාශ වීමක් අපේක්ෂා කෙරේ.

#### 1.2.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: ස්වතන්ත්‍ර කෙටි නාට්‍ය

- මෙම වර්ෂය සඳහා සමකාලීන පුවත්පත් වාර්තාවක් පාදක කර ගත යුතු ය.
- අයදුම්පත සමග පුවත්පත් වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයේ සිසු සිසුවියන්ට සහභාගී විය හැකි ය. නාට්‍යයේ පෙළ විසින් ඉල්ලා සිටිනු ලබන සුවිශේෂ අවස්ථාවක දී ඉහත පොදු නීතිරීතිවල 2.1 කොන්දේසිය අදාළ වේ.
- කාලය උපරිමය විනාඩි 25 කි.
- පාසල් සිසුන්ට උචිත, ඒකීය රංග වින්‍යාසයක් පාදක කොට ගත හැකිය.
- රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- සුදුසු ශෛලියක් නාට්‍ය නිර්මාණය සඳහා යොදා ගත හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

### 1.3. ළමා ප්‍රේක්ෂකාගාරයක් සඳහා විශ්ව සාහිත්‍ය පාදක නාට්‍ය

ලෝපිත විශ්ව සාහිත්‍යකරුවකුගේ හෝ විශ්ව සාහිත්‍ය කෘතියක ළමුන්ට යෝග්‍ය කතාවක් පාදක කර ගනිමින්, ළමුන්ට මෙන්ම වැඩිහිටියන්ට ද එක සේ රස විඳිය හැකි සේ නිර්මිත නාට්‍ය නිෂ්පාදනයක් විය යුතු ය. ළමා නාට්‍ය වශයෙන් දැනට මෙරට ප්‍රචලිතව පවත්නා නාට්‍ය වර්ගයට වඩා සැම අතකින්ම නිර්මාණශීලී, අභිනවත්ම නාට්‍යානුසාරී සහ ගැඹුරු කලාත්මක බද්ධතාවකින් මින් අපේක්ෂිත ය.

#### 1.3.1 විවෘත අංශය

- කාලය උපරිම විනාඩි 25 කි.
- 1 සිට 13 ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන්ට සහභාගී විය හැකි ය.
- විදේශීය කතාවක් ආශ්‍රිත නිර්මාණයක් විය යුතු ය.
- අයදුම්පත සමග මුල් කතාවේ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර පොතක් නම් එහි ප්‍රකාශකයා හා ප්‍රකාශිත වර්ෂය පිළිබඳ තොරතුරු ද ඇතුළත් විය යුතු ය.
- රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

## 1.4. විකල්ප හා පර්යේෂණාත්මක නාට්‍ය ප්‍රවේශයන්

**(මෙම අංශය යටතේ විවිධ විකල්ප හා පර්යේෂණාත්මක රංග ප්‍රවේශයන් වර්ෂයකට එකක් බැගින් භාවිතයට ගැනේ)**

### 1.4.1 ජ්‍යෙෂ්ඨ අංශය: අවකාශ විශේෂී රංගය (Site Specific Theatre)

- ගැහැණු/පිරිමි වශයෙන් වර්ග කිරීමක් නැත.
- කාලය උපරිම විනාඩි 30ත් 45ත් අතර විය යුතු ය.
- නිර්මාණයේ සියලුම අංග ස්වතන්ත්‍ර විය යුතු ය.
- සාම්ප්‍රදායික පින්තූර රාමු වේදිකාවක් හෝ එළිමහන් රංග භූමියක් භාවිතයෙන් බැහැරව හෝ සාම්ප්‍රදායික නොවන අවකාශයක රංගය ඉදිරිපත් කිරීම අවකාශ විශේෂී (Site Specific) රංගයේ දී අපේක්ෂා කෙරේ. එකම අවකාශයක තෝරාගත් පරිශ්‍ර කිහිපයක වුව ද රංගය සැලසුම් කරගත හැකිය. නිදසුනකට, අතහැර දැමූ ගොඩනැගිල්ලක්, වී ගබඩාවක්, ක්‍රීඩාගාරයක්, පාසැල පරිශ්‍රයක්, ගොවිපොළක්, කර්මාන්ත ශාලාවක් යනාදිය මෙම රංගය ඉදිරිපත් කිරීමට යොදාගත හැකි අවකාශ ලෙස සඳහන් කළ හැකි ය.
- මේ සඳහා අයදුම් කරන පාසල්, තම නිර්මාණයට භාවිත කිරීමට තෝරාගත් අවකාශය (Site) පිළිබඳ තොරතුරු, ඡායාරූප, නාට්‍ය පිටපත සහ පරිශ්‍රයේ සුවිශේෂතාවන් සහ රංග කාර්යය නිර්මාණාත්මකව සංකලනය කිරීම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් සම්පූර්ණ රංග සැලැස්ම ව්‍යාපෘති වාර්තාවක් ලෙසින් ඉදිරිපත් කළ යුතු ය.
- සුවිශේෂිත නිර්ණයක් මැවින් මෙහි පළාත් වටයක් හෝ පළාත් පාදක ඇගයීමක් නොමැති අතර රංග ව්‍යාපෘති යෝජනාව සමාලෝචනයෙන් ඇගයීම් මණ්ඩලය තෝරා දෙනු ලබන හොඳම නිර්මාණ උපරිම 11ක් (එක් පළාතකට එකක් බැගින් සහ ජූරියේ නිර්දේශ මත තෝරාගන්නා දෙකක් වශයෙන්) ජාතික වටයක් ලෙස ඇගයීමට ලක් කෙරේ.
- නිර්මාණාත්මක වශයෙන් ඉහළ ප්‍රමිතියකින් තොර බවට ඇගැයීම් මණ්ඩලය නිර්ණය කරන නිර්මාණ මෙම තේරීම් වටයේදීම ඉවත් කෙරේ.
- මෙම ව්‍යාපෘති වාර්තා ඇගැයීමෙන් තෝරාගන්නා පාසල් තම නිර්මාණය අදාල ක්ෂේත්‍රයේ රංගගත කළ යුතු අතර අමාත්‍යාංශයීය ඇගැයීම් මණ්ඩලය එම ක්ෂේත්‍රයට පැමිණ එය ඇගැයීමට ලක් කරනු ඇත. මෙම රංගගත කිරීම පාසලට අවශ්‍ය නම් මහජන දර්ශනයක් ලෙස වුව ද පැවැත්වීම වඩාත් යෝග්‍ය වනු ඇත.
- රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

## 1.5. ඒකපාත්‍ර නාට්‍ය (Monodrama)

**එක් පාත්‍රයෙක් පමණක් සිටින නාට්‍යයකි.**

### 1.5.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: ඒකල

- ගැහැණු/පිරිමි වශයෙන් වර්ග කිරීමක් නැත.
- ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර චරිතය ඉස්මතු විය යුතු ය.
- ශබ්ද හා සංගීත සංයෝජනයන් මෙන්ම අනෙකුත් ආනුෂංගික අංග භාවිතයට ද අවස්ථාව ඇත.
- උපරිම කාලය විනාඩි 10 කි. අවම කාලය විනාඩි 05කි.
- නිර්මාණ සංඛ්‍යාව උපරිම 11ක් නොඉක්මවන සේ පළාත් ප්‍රථම ස්ථානවලට අනිවාර්යව ජූරියේ නිර්දේශිත හොඳම නිර්මාණ ජාතික වටයට තෝරා ගැනේ

# 2 කාණ්ඩය – නිර්දේශිත නාට්‍ය ජවනිකා

## 2.1 නූතන දෙස්/විදෙස් නාට්‍යකරුවන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**නම් කරන ලද දේශීය / විදේශීය නාට්‍යකරුවන්ගේ නාට්‍ය ඇසුරෙන් තෝරාගත් නාට්‍යමය කොටස් නිරූපණය කිරීමයි. (මෙම අංශයේ දී එක් වර්ෂයක දී යෝජිත දේශීය කරුවන්ගේ නිර්මාණ යොදා ගැනෙන්නේ නම් අනෙක් වර්ෂයේ දී භාවිත වන්නේ යෝජිත විදේශීය නාට්‍යකරුවන්ගේ නිර්මාණ ය)**

**2.1.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: 2021 වර්ෂයට යෝජිත විදේශීය නාට්‍යකරුවා – හෙන්රික් ඉබ්සන්**

- හෙන්රික් ඉබ්සන්ගේ වන තාරාවී (The Wild Duck), සමුදුරෙන් ආ ළඳ (The Lady From the Sea) සහ සමාජයේ කුළු කණු (The Pillars of Society) යන නාට්‍ය තුනෙන් එකකින් තෝරාගත් කොටසක් විය යුතු ය.

## 2.2 ග්‍රීක-රෝම හා ශේක්ස්පියරියානු නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**(මෙම අංශයේ දී එක් වර්ෂයක දී ග්‍රීක – රෝම ප්‍රහසන භාවිත කෙරෙන්නේ නම් ඊ ළඟ වසරේ දී භාවිත වන්නේ ග්‍රීක – රෝම ඛේදජනක නාට්‍ය වේ. ශේක්ස්පියරියානු නාට්‍ය ශීර්ෂයේ දී විලියම් ශේක්ස්පියර්ගේ ඛේදජනක, සුඛ ජනක හා ඓතිහාසික (Histories) නාට්‍ය වර්ගයකට එකක් බැගින් භාවිතයට ගැනේ)**

**2.2.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: ග්‍රීක හා රෝම ඛේදාන්ත නාට්‍ය**

- නිර්දේශිත ග්‍රීක ඛේදාන්ත නාට්‍යයකින් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙම වසර සඳහා අපේක්ෂා කෙරේ.
- ග්‍රීක නාට්‍යකරු යුරිපිඩීස්ගේ මීඩියා, හිපොලිටස් හා ඇල්සෙස්ටිස් යන නාට්‍ය තුනෙන් එකකින් තෝරාගත් කොටසක් විය යුතු ය.
- දැනට සිංහල පරිවර්තනයන් වශයෙන් නිකුත් වී ඇති නාට්‍ය කෘතීන් මෙන් ම, ඔබ විසින් ම සිදු කරන පරිවර්තනයන් ද පාදක කොට ගත හැකි ය.
- පරිගණක කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

**2.2.2 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: ශේක්ස්පියර් නාට්‍ය**

- විලියම් ශේක්ස්පියර්ගේ ඛේදජනක (Tragedy) නාට්‍ය කණ්ඩයේ රෝමියෝ ජුලියට් නාට්‍යයෙන් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- පරිගණක කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.
- නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කිරීමේ දී, මෙම චක්‍රලේඛයෙහි අංක 7.2 හා 7.3 වගන්තිවල සඳහන් කරුණු පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

## 2.3 සංස්කෘත හා සරච්චන්ද්‍ර නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**මෙම අංශයේ දී එක් වර්ෂයක දී සංස්කෘත නාට්‍ය යොදා ගැනෙන්නේ නම් අනෙක් වර්ෂයේ දී භාවිත වන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍යකරුවාගේ නිර්මාණ වේ**

**2.3.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: සරච්චන්ද්‍ර නාට්‍ය**

- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ එලොව ගිහින් මෙලොව ආවා නාට්‍යයෙන් තෝරාගත් ජවනිකාවක් විය යුතු ය.
- සංගීත භාවිතය මුල් කෘතියට අනුකූලව සිදු කළ යුතු වේ.
- මෙම නිර්මාණ කිසිදු විද්‍යුත් මාධ්‍යයකින් ප්‍රචාරය නො කළ යුතු ය.

**ඉහත සිරස් අංක 2.1.1, 2.2.1, 2.2.2, 2.3.1 සඳහා පොදු කොන්දේසි**

- 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට පමණක් සීමා විය යුතුය
- කාලය උපරිම විනාඩි 15ක් විය යුතුය.
- අදාළ නාට්‍ය පෙළට අනුව රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව තීරණය කර ගත හැකි ය.
- තෝරාගත් නාට්‍ය කොටස, මුල් පිටපතට අනුකූල විය යුතු අතර කවර අයුරකින්වත් නාට්‍ය පෙළ වෙනස් කිරීමක් හෝ විකෘති කිරීමක් සිදු නො කළ යුතුය.
- ආනුෂංගික අංග නාට්‍යයේ මුල් කෘතියට හානි නො වන සේ භාවිත විය යුතු ය.

# 3 කාණ්ඩය – ඒකල රංගන, භූමිකා රංගන සහ කතාන්දර කථනය

## 3.1 කතාන්දර කථනය

**දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු සමකාලීන කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය.**

**3.1.1 ප්‍රාථමික අංශය ඒකල – විවෘත -**

- මෙම අංශය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලැබීමට කලාප නිෂ්පාදන නිර්ණයකට ඉදිරිපත් වීමේ අනිවාර්යතාවයෙන් සිසු සංඛ්‍යාව 500ට අඩු පාසල් නිදහස් කෙරේ.
- කාලය විනාඩි උපරිම විනාඩි 05ක් විය යුතු ය.

**3.1.2 කනිෂ්ඨ ද්විතීයික අංශය සමූහ – විවෘත -**

- මෙම අංශය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලැබීමට කලාප නිෂ්පාදන නිර්ණයකට ඉදිරිපත් වීමේ අනිවාර්යතාවයෙන් සිසු සංඛ්‍යාව 500ට අඩු පාසල් නිදහස් කෙරේ.
- සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
- කාලය විනාඩි උපරිම විනාඩි 05ක් විය යුතු ය.

**3.1.3 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය - සමූහ – විවෘත (10-11 ශ්‍රේණි)**

- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**3.1.4 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය - ඒකල - ගැහැනු (10-13 ශ්‍රේණි)**

- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**3.1.5 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය - ඒකල - පිරිමි (10-13 ශ්‍රේණි)**

- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**ඉහත 3.1.1, 3.1.2, 3.1.3, 3.1.4, සහ 3.1.5 යන තරග සඳහා පොදු කොන්දේසි**

- දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ දරුවන්ගේ වයස් මට්ටමට ගැලපෙන වෙනත් සුදුසු සමකාලීන කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතු ය.
- රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්වරූපීය වශයෙන් සපයා ගත හැකි ඒවායෙන් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම උපකරණ පමණක් භාවිත කළ හැක.
- ඉදිරිපත් කරන්නාට පසුබිමින් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයකට වුව ද ඉඩ ඇත.
- රූපක වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.

## 3.2 භූමිකා රංගන / ගැමි නාටක චරිත නිරූපණ / අභිරූපණ

**වාචික අභිනය කේන්ද්‍රීයව රංගන හැකියාව ඇගයීම මෙහි මූලික අරමුණ වන මෙම කාණ්ඩයේ ඒකල භූමිකා රංගන සඳහා පහත නිර්දේශිත නාටක කොටසක් ඉදිරිපත් කිරීම අපේක්ෂිතය. ගැමි නාටක චරිත නිරූපණ අංශයේ දී ශ්‍රී ලංකාවේ දේශීය ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය පෙළපාළියක් හෝ අන්තර් රංග අවස්ථාවක් හෝ සොකරි හා කෝලම් නාට්‍ය නිර්මාණ ආශ්‍රිත අවස්ථාවක් ආශ්‍රිත නිරූපණයක් අපේක්ෂිත ය. අභිරූපණයේ දී අවස්ථාවක් හෝ සිද්ධියක් ප්‍රකාශ වන සේ වාචික අභිනයෙන් තොර ව කෙරෙන නිර්මාණාත්මක ප්‍රකාශන රංගනයක් අපේක්ෂා කෙරේ.**

**3.2.1 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: ඒකල භාෂණය - ගැහැනු (12-13 ශ්‍රේණි)**

**3.2.2 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය: ඒකල භාෂණය - පිරිමි (12-13 ශ්‍රේණි)**

**ඉහත 3.2.1 සහ 3.2.2 මට්ටම සඳහා පොදු කොන්දේසි**

- කාලය විනාඩි 03 - 05 අතර විය යුතුය.
- දැනට අ.පො.ස. උසස් පෙළ විභාගයේ නාට්‍ය හා රංග කලාව විෂය ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නියම කර ඇති මූලාශ්‍රයේ A.1.1., A.1.2 පෙළ ආශ්‍රිත නාට්‍ය රංගනය සඳහා ලබා දී ඇති නාට්‍ය කොටස් දහයෙන් එකක් පමණක් භාවිත කළ යුතු ය.
- මුල් නාට්‍යයේ අර්ථයට හානි නො විය යුතු අතර එම පෙළ වෙනස් නොකළ යුතු ය.
- මුල් නාට්‍යයේ අර්ථයට සීමා නොකරන භාවමය අර්ථ විවරණයන් සඳහා නිදහස තිබේ.
- තෝරාගත් නාට්‍ය කොටස ඒකකයෙන් නිරූපණය ඉදිරිපත් කළ යුතු වේ. එහෙත් මට්ටම් ඇගයීමේ දී රංගනයේ ගුණාත්මක බව ප්‍රමුඛ වශයෙන් සලකා බලනු ලබන අතර, ඉදිරිපත් කිරීමට ගන්නා කාලය ද අතිරේක වශයෙන් සැලකිල්ලට ගනු ලැබේ.
- පෙළ මතක් කිරීමට ඉඩ නොලැබේ.
- නිර්මාණයේ සඳහා ලද කාල සීමාවන් සහිත ඇගයීම් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සිදු කළ හැකි ය.
- සියලු දරුවන් සහ සහභාගී වී කණ්ඩායමින් ඝන වින කලිසමකින් සැරසී ඉදිරිපත් විය යුතු අතර චරිතයට අදාළ රංග වේශ සහ අංග රචනයක් භාවිත නොකළ යුතු ය.
- රංගනයේ දී භාවිත කිරීමට අත්‍යවශ්‍ය වන යම් රංග භාණ්ඩයක් හෝ වෙනත් සරල පසුතලමය ආධාරකයක් (උදා. පුටුවක්) හැර අන් කිසිවක් භාවිත නොකළ යුතු ය.
- පසුබිම් සංගීතය හෝ ශබ්ද භාවිත නොකළ යුතු ය.

**3.2.3 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: ඒකල රැඟුම් නාට්‍ය චරිත නිරූපණ**

- ගැහැණු/පිරිමි වශයෙන් වර්ග කිරීමක් නැත.
- ශ්‍රී ලාංකේය දේශීය සාම්ප්‍රදායික ආශ්‍රිත නාට්‍යමය පෙළපාලියක් හෝ අන්තර් රංග අවස්ථාවක් හෝ සොකරි හා කෝලම් නාට්‍ය නිර්මාණ ආශ්‍රිත අවස්ථාවක් ආශ්‍රිත නිරූපණයක් අපේක්ෂිත ය.
- සංවාද සහිත නාට්‍යමය අවස්ථාවක් ඉදිරිපත් කළ යුතු අතර බෙර වාදන ශිල්පියෙක් පමණක් සහාය කර ගත හැකි ය.
- වෙස් මුහුණු භාවිත නොකළ යුතු අතර සරල අංග රචනයකට ඉඩ ඇත.
- සාම්ප්‍රදායික තම්මැට්ටම, දවුල, ගැටබෙර, මද්දළය සහිත විය යුතු ය.
- සහභාගී විය හැක්කේ 10-13 ශ්‍රේණිවල සිසුන්ට පමණි.
- කාලය උපරිම විනාඩි 08 කි.

**3.2.4 විවෘත අංශය, සමූහ අභිරූපණ**

- 01 සිට 13 ශ්‍රේණි වල සිසුන්ට පමණක් සීමා විය යුතුය.
- ගැහැණු / පිරිමි / මිශ්‍ර වශයෙන් වර්ග කිරීමක් නැත.
- කාලය විනාඩි 05ත් 10ත් අතර විය යුතුය.
- ජීවමාන සංගීතයක් යොදාගත හැකිය.
- සජීවී මෙන්ම පටිගත කරන ලද සංගීතය ද භාවිත කළ හැකි ය.
- අවශ්‍යනම් ආනුෂංගික අංග නිර්මාණයට උචිතව යොදාගත හැකිය.
- රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව 02 ත් 10 ත් අතර විය යුතුය.
- ජාතික මට්ටමේ ඇගයීමේ දී, පළාත් මට්ටමට තමන් ඉදිරිපත් කළ නිර්මාණය අවසාන ඇගයීම් මණ්ඩලය විසින් දෙන නිර්දේශවලට හා කොන්දේසි අනුව අභිරූපණ රංගනයක් ඉදිරිපත් කළ යුතු ය.